**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2015**

**----------------------------------------------------------**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22(ඒ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13**

කොමිෂන් සභාව විසින් දේපළ, පිරියත හා උපකරණ එහි පිරිවැය වූ රු. 13,025,534,171 කට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එහි සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01**

වියදම්වල ස්වභාවය අනුව හෝ ආයතනයේ කාර්යයන්ට අදාලවන ආකාරයට ආයතනයක් විසින් දරනු ලබන වියදම්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වුවත් කොමිෂන් සභාවේ කාර්යයන්වලට පරිබාහිර කාර්යයන් සඳහා වැය කර තිබුණු රු. 44,636,888 ක් සභාවේ කටයුතු නියාමනය කිරීමේ වියදම් (Regulatory Expenses) ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොමිෂන් සභාවට අයත්ව තිබූ අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අත්පත් කරගෙන තිබුණු අතර සම්පූර්ණ ඉඩමේ වටිනාකම රු. මිලියන 45ක් වශයෙන් දේපළ පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි. වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වුවත් පසුගිය වර්ෂ 13 තුළ මෙය ගිණුම් සටහනක් මගින් පමණක් පෙන්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගනු ලබන පිරිවැය රු. 465,580,673 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18**

මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර අවුරුදු 10කට හා 05කට වරක් නිකුත් කරන බැවින් බලපත්‍ර ගාස්තු අළුත් කිරීමේදී අයකරන ගාස්තු අළුත් කිරීම සිදුකළ වර්ෂයේ ආදායමක් ලෙස

හඳුනාගෙන තිබුණි. එසේ වුවත් මේ සඳහා අදාල කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ රු. 261,816,469 ක් වූ මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු සමාලෝචිත වර්ෂයේදී රු. 107,708,483 ක් දක්වා විචලනය වී තිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23**

**-----------------------------------**

නෙළුම් කුළුණ ඉදිකිරීම කටයුතු සඳහා එ.ජ. ඩොලර් මිලියන 88.655ක ණය මුදලක් 2012 වර්ෂයේදී ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එයින් එ.ජ. ඩොලර් මිලියන 38.28ක් වැය කර තිබුණි. මෙම ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. මිලියන 1,664 ක ණය ගැනුම් පිරිවැයක් දරා තිබුණද ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රාග්ධනිත කරන ලද සුදුසුකම් ලත් ණය ගැනුම් පිරිවැයෙහි ප්‍රමාණය සහ එය ප්‍රාග්ධනිත කිරීමේ අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයට අදාල එහෙත් සමාලෝචිත වර්ෂයේ ඉන්වොයිස් කරන ලද රු. 14,886,858 ක් වූ සංඛ්‍යාත බලපත්‍ර ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ සංඛ්‍යාත බලපත්‍ර ආදායම එම අගයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් ක්ෂය රු.782,882 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වාහන 07 ක් විකුණා තිබූ අතර එම වාහන විකිණීමෙන් ලද ලාභය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු. 335,428 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. එසේම එක් වාහනයක පිරිවැය වෙනුවට එහි වෙළඳ මිල වූ රු. 3,500,000 ක වටිනාකම ගිණුම්වලින් ඉවත් කර තිබුණු අතර එම වාහනයේ පිරිවැය කොමිෂන් සභාවට හඳුනා ගත නොහැකිව තිබුණි. මෙම නිසා එම වාහනය ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය හඳුනාගත නොහැකිවී තිබුණි.

(ඈ) 2015 අංක 10 දරන මුදල් පනතට අනුව ගෙවන ලද සුපිරි වාසි බදු (Super Gain Tax) සමාලෝචිත වර්ෂයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ ආරම්භක රඳවාගත් ඉපැයුම් ශේෂයට ගැලපිය යුතු වුවත් කොමිෂන් සභාව විසින් රු. 464,030,556 ක් වූ බදු මුදල ප්‍රවර්තන වර්ෂයේ බදු පෙර ලාභයෙන් අඩුකර පෙන්වා තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ බදුපසු ලාභය රු. 464,030,556 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විණි. එමෙන්ම සුපිරි වාසි බද්ද සම්බන්ධව කළ යුතු හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඉ) වර්ෂයේ ආදායම් බදු වගකීම ගණනයේදී නේවාසික විදේශ මුදල් ගිණුමේ (RFC) පොලී ආදායම වූ රු. 1,622,984 වෙනුවට එම ගිණුමේ ශේෂය වූ රු. 80,133,171 ක මුදල බදු නිදහස් ආදායම් ලෙස දැක්වීම හේතුවෙන් බදු අයකළ හැකි ආදායම රු. 78,510,187 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම රු. 21,982,852 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශක සේවාවන් ලබාගැනීමේ වියදමද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වූ රු. 7,268,291 ක වියදම්

උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබුණ අතර 2016 වර්ෂයේදී විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරියෙකුට ගෙවිය යුතු පාරිතෝෂිත දීමනාව වූ රු. 444,812 ක් ජංගම වගකීමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි.

( උ) යුධ හමුදා සුභ සාධන අරමුදල වෙත පසුගිය වර්ෂයේ ගෙවා තිබුණු රු. මිලියන 50 ක මුදලින් සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව වෙත ආපසු ලැබුණු රු. 27,722,963 ආර්ථික හා සමාජ වගකීම් වියදම් ගිණුමට බැර කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ආර්ථික හා සමාජ වගකීම් වියදම එම මුදලින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඌ) සන්නිවේදන ක්‍රියාකරුවන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,305,544,313 ක මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබූ අතර එක් ක්‍රියාකරුවෙකුගෙන් අයවිය යුතු ශේෂය ගණනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක ලැබිය යුතු ගිණුම් තුළ එකතු කළ අගය මත බදු ලෙස රු.141,398,308 ක් පෙන්වා තිබුණද එම ශේෂය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවෙහි ණයගැතියන් වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ශේෂයෙන් රු. 371,620,005 ක් වර්ෂ 02 කට වැඩි ණය ශේෂයන් වශයෙන් වර්ගීකරණය කර තිබුණද, එම ශේෂය තුළ වර්ෂ 20 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවති ණය ශේෂයන්ද ඇතුළත් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට ලබාදුන් සංඛ්‍යාත සඳහා 1981 වර්ෂයේ සිට රු. 119,920,691 ක ගාස්තුවක් අයවිය යුතුව තිබුණු අතර 1998 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම ඉන්වොයිස් නොකරන ලද සංඛ්‍යාතද තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සංඛ්‍යාත 10 ක් සඳහා ඉන්වොයිස් කර නොතිබුණි.

(ඇ) වර්ෂ 02ට වැඩි කාලයක සිට අයනොවී පවතින සේවක ණය ශේෂය රු. 2,663,325 ක් විය.

(ඈ) සංඛ්‍යාත භාවිතා කරන ආයතන හෝ පුද්ගලයන් ලියාපදිංචිය සඳහා වූ පොදු උපදෙස්වලට අනුව සමාගමකින් සංස්ථා පත්‍රයේ හා සාංගමික ව්‍යවස්ථාවලියේ සහතික කරන ලද පිටපත් ලබා නොගැනීම හේතුවෙන් එම සමාගමෙන් අයවිය යුතු රු. 8,889,143 ක ගාස්තුව අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කොකාවිල් ඇන්ටනා සහ ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරනු ලබන ක්‍රියාකරුවන්ගෙන් රු. 83,477,885 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ණයගැති ශේෂ ලැයිස්තුව අනුව රු. 1,730,775 ක සෘණ ශේෂයන් සහිත ණයගැතියන්ගේ සංඛ්‍යාව 462ක් වූ අතර මෙම සෘණ ශේෂය නිරවුල් කිරීමට හෝ ලියා හැරීමට කටයුතු නොකර දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව ගිණුම්වල පෙන්වා තිබුණි.

(උ) කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂයෙන් රු. මිලියන 1 ට වැඩි එකතුව රු. 2,024,252,991 ක් වූ ණයගැතියන් 16 දෙනෙකු සඳහා ශේෂ තහවුරු කරගැනීමේ ලිපි යවා තිබුණද එකතුව රු. 336,260,623 ක්වූ ණයගැතියන් 11 දෙනෙකු ශේෂ තහවුරු කර නොතිබුණි.

(ඌ) 2015 අංක 10 දරන මුදල් පනතේ IV වන කොටස අනුව සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 15 දිනට පෙර අයකරගත යුතු ජංගම දුරකථන ක්‍රියාකරුවන්ගේ බදු මුදල වන රු.250,000,000 ක් එක් ක්‍රියාකරුවකු කොමිෂන් සභාව වෙත ගෙවා නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2000 ජූනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/09 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් රු.21,900,000,000 ක මුදලක් ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 2015 අංක 10 දරන මුදල් පනතේ V සහ VII කොටස | අදාල ක්‍රියාකරුවන්ගෙන් අයකර ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු චන්ද්‍රිකා ස්ථාන අය බද්ද (Satellite Location Tax)සහ ක්‍රීඩා සඳහා වෙන්වූ නාලිකා අය බද්ද (Dedicated Sports Channel Tax) අයකර ගැනීමේ වගකීම කොමිෂන් සභාව වෙත පැවරී තිබුණද එම මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි. |
| (ඈ) | 2011 ජනවාරි 27 දිනැති අංක පීඊ 56 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | ආයතනයේ මාස 06ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවා ඇති අරමුදල් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළයුතු වුවද කොමිෂන් සභාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2015 ජූනි 17 දිනැති 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.3 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන අනුව කොමිෂන් සභාවේ සභාපතිවරයාට දීමනා ලෙස නියමිත දීමනාවෙන් සියයට 50 ක් ගෙවිය යුතු වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේ සිට රු. 100,000 බැගින් සම්පූර්ණ දීමනාවම ගෙවා තිබුණි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග වෙනුවෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | 1990 පෙබරවාරි 19 දිනැති ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ ලිපිය | රාජ්‍ය සංස්ථා, රජයේ ආයතන, වෙළඳ ව්‍යාපාර සහ මහජන සමාගම්වල සියළු නෛතික වැඩ කටයුතු සම්බන්ධයෙන් සේවාවන් නීතිපතිවරයා විසින් ඉටුකළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණද, ඊට පටහැනිව කොමිෂන් සභාව නීතිමය සේවාවන් ලබාගැනීම වෙනුවෙන් පුද්ගලයන් හා පෞද්ගලික ආයතන වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු. 4,105,707 ක් ගෙවා තිබුණි. |
| (ඌ) | 2007 ජූනි 12 දිනැති අංක 15/2007 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7.4.1 උප වගන්තිය | (i) වාහන ණය ගෙවීම වාණිජ බැංකු මගින් සිදුකළ යුතු බව දන්වා තිබුණද 2013 අගෝස්තු 14 දිනැති අංක TRC/04/12 දරන කොමිෂන් සභාවේ අභ්‍යන්තර චක්‍රලේඛයක් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 11 දෙනෙකුට එකතුව රු.18,195,250 ක වාහන ණය කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවා තිබුණි.<br><br>(ii) වාහන ණය ලබාදීමේදී අයකළ යුතු පොලිය පිළිබඳව මහා භාණ්ඩාගාරයෙන් විමසීම් නොකොට ඉහත චක්‍රලේඛයේ විධිවිධාන අනුව සියයට 4.2 ක වාර්ෂික පොලියක් පමණක් කොමිෂන් සභාව විසින් අයකරගෙන තිබුණි. |
| (එ) | 2005 ජනවාරි 27 දිනැති අංක PED/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඒ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය | කොමිෂන් සභා අනුමැතිය මත කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයින් බඳවා ගැනීම වෙනුවෙන් පිළියෙල කරන ලද බඳවා ගැනීම් පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාවය ලබාගැනීමකින් තොරව බඳවා ගැනීම් සිදුකර තිබුණි. |
| (ඔ) | 2011 දෙසැම්බර් 30 දිනැති අංක බීඩී/සීපීබී/1/1/2012 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය | සේවකයකු සඳහා ගෙවිය හැකි සමස්ථ ආපදා ණය ප්‍රමාණය රු.250,000 ක උපරිමයකට සීමා කළ යුතු වුවත් TRC/04/12 දරන අභ්‍යන්තර චක්‍රලේඛය අනුව එම සීමාව ඉක්මවා අවස්ථා 10 කදී එකතුව රු. 997,437 ක් ගෙවා තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභා තීරණ පමණක් පදනම් කරගෙන පැමිණීමේ දීමනා, ප්‍රසාද දීමනා, සන්නිවේදන දීමනා හා නිවාස කුලී දීමනා ලෙස සභාවේ නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 35,926,229 ක් ගෙවා තිබුණි.

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධනවලට අනුව උපයනවිට ගෙවීම් මත බදු අදාළ නිලධාරීන්ගෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 9,039,777 ක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ බදු පෙර ලාභය රු.47,593,376,236 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු. 46,266,149,704 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,327,226,532 ක වර්ධනයක් දක්නට ලැබුණි. බලපත්‍ර ගාස්තු ආදායම රු. 2,482,599,329 කින් අඩුවී තිබුණද විදුලි සංදේශ බදු ආදායම සහ ජංගම දුරකථන ක්‍රියාකරුවන්ගේ බදු ආදායම රු. 3,054,219,871 කින් වැඩිවීම සහ නියාමන වියදම රු. 917,050,977 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 දායකත්වය**

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දායකත්වයෙහි වැඩිවීම රු. 1,388,735,990 ක් පෙන්නුම් කළද 2015 අංක 10 දරන මුදල් පනත අනුව සමාලෝචිත වර්ෂයේදී එකතු කර තිබුණු රු.1,250,000,000 ක ජංගම දුරකථන ක්‍රියාකරු බද්දේ බලපෑම ඉවත් කළ පසු, සමාලෝචිත වර්ෂයේ දායකත්වයෙහි වැඩිවීම රු. 138,735,990 ක් විය. එසේම ඉකුත් වර්ෂයේ මෙහෙයුම් කටයුතුවලට අදාල නොවන්නා වූ රු. 716,224,838 ක වියදමක් සමාලෝචිත වර්ෂයේ සිදුනොවීම නිසා වූ බලපෑම ඉවත්කළ විට සමාලෝචිත වර්ෂයේ දායකත්වය රු. 577,488,848 කින් අඩුවන බව තවදුරටත් නිරීක්ෂණය විය.

**3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී කොමිෂන් සභාවේ ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් වූ අතර ඒ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය තුල සිදුකරන ලද ස්ථාවර තැන්පතු ආයෝජන රු.74,106,362,761 සිට රු.33,250,000,000 දක්වා අඩුවීම සහ ස්ථාවර තැන්පතු පොලී අනුපාතයෙහි පහල යාම හේතුවෙන් තැන්පතු මත පොළී ආදායම සියයට 74 කින් අඩුවී තිබුණි.

(ආ) 2015 අංක 10 දරන මුදල් පනත අනුව ජංගම දුරකථන ක්‍රියාකරුවන්ගෙන් නව බද්දක් අයකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,250,000,000 ක ආදායමක් ලැබී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී කොමිෂන් සභාවේ අරමුණුවලට පටහැනි වියදම් දරා එම වියදම් කොමිෂන් සභාවේ ආර්ථික හා සමාජීය වගකීම් වියදම් ලෙස දක්වා තිබූ නමුත් එවැනි වියදම් සමාලෝචිත වර්ෂය තුළදී සියයට 90 කින් අඩුවී තිබුණි.

**3.4 කොමිෂන් සභාවට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

බාහිර ආයතන, බාහිර පුද්ගලයින් හා ආයතනයේ සේවකයින් විසින් කොමිසමට එරෙහිව අධිකරණවල නඩු 15 ක් ගොනුකර තිබුණු අතර එයින් බාහිර ආයතන 02ක් විසින් සංඛ්‍යාත ව්‍යාපෘතිය

ක්‍රියාත්මක නොවීම හා කොන්ත්‍රාත් ගිවිසුම කඩවීම මත කොමිෂන් සභාවෙන් එකතුව රු. මිලියන 47,346ක් වන්දි ලෙස ඉල්ලා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ නියාමන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, මහජන යහපත ආරක්ෂා කිරීම සහ වැඩිවන තරඟකාරී වෙළඳපළේ අභියෝග වලට ප්‍රතිචාරීව විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම වේ. මෙම අරමුණ ලඟාකර ගැනීමට අවශ්‍ය කාර්යයන් නිශ්චය කර දක්වමින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. එම නිසා ආයතනයේ අරමුණු ගත කාර්යයන් සැලසුම් කිරීම සහ එම කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විදුලි සංදේශ ජාලය නිසියාකාරව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම කොමිෂන් සභාවේ අරමුණක් වුවත් සංඛ්‍යාත භාවිතයේදී විවිධ බාධාවීම් සිදුවන බව අනාවරණය විය. කොමිෂන් සභාවේ තොරතුරුවලට අනුව, පවතින සංඥා පද්ධතිය අවුරුදු 17 කට වඩා පැරණි බැවින්, පැරණි පද්ධතිය වෙනුවට නව පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළදීද ඉටු කර නොතිබුණි.

(ඇ) සමාගමක් විසින් භාවිතා කරමින් සිටි 2430-2483.5 MHz පොදු සංඛ්‍යාත පරාසය භාවිතා නොකරන බව 2014 අගෝස්තු 13 දිනැති ලිපියෙන් එම සමාගම දන්වා තිබුණද කොමිෂන් සභාව විසින් එම සමාගමට මෙම සංඛ්‍යාත භාවිතය අවලංගු කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් ස්ථාවර හා ජංගම මෙහෙයුම් මධ්‍යස්ථාන(Fixed and mobile Monitoring Stations)ස්ථාපිත කර තිබුණද, සංඛ්‍යාත භාවිතා කරනු ලබන පාර්ශවයන් සංඛ්‍යාත ගාස්තු නොගෙවන අවස්ථාවලදී එම පාර්ශවයන් සඳහා වෙන් කරන ලද සංඛ්‍යාත භාවිතා කරන්නේද නැද්ද යන්න පිළිබඳ අධීක්ෂණය කිරීම ක්‍රමානුකූලව සිදුකර නොතිබුණි. සංඛ්‍යාත පිරික්සුම් කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙක් පමණක් සිටින බැවින් දිවයින පුරා පිරික්සුම් කිරීමට කිසිදු හැකියාවක් නොමැති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත දන්වා තිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22(උ) වගන්තිය යටතේ වූ නියමය පරිදි සහ 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව එක් ආයතනයක් සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සෙස් ගාස්තු ගෙවා නොතිබුණි. එසේ වුවත් පැහැර හරිනු ලබන බදු අයකර ගැනීමේ නීතිමය ප්‍රතිපාදන පනතේ නොවීම නිසා පැහැර හරින ලද බදු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

සෙස් බදු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන් සඳහා දඩ මුදලක් අයකර ගැනීම සඳහා නීතිමය බලය ලබාගැනීමේ අරමුණෙන් විදුලි සංදේශ පනතට වගන්ති ඇතුළත් කිරීමට කටයුතු කරන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2011 වර්ෂයේ සිට වරින් වර මා වෙත දන්වා ඇතත් මෙතෙක් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සංඛ්‍යාත ගාස්තුව සඳහා ඉන්වොයිසිය නිකුත් කර සති 02 ක් තුළදී ක්‍රියාකරුවන් විසින් අදාල මුදල ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කරන ලද එකතුව රු.1,048,313,680 ක් වූ ඉන්වොයිසි 12 ක් සඳහා දින 07 සිට මාස 04 දක්වා වූ කාල ප්‍රමාදයන් සහිතව මුදල් ගෙවා තිබුණි. සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් ගෙවීම ප්‍රමාද කරන හා පැහැරහරින ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2006 පෙබරවාරි සිට 2013 පෙබරවාරි දක්වා ජීවන වියදම් දීමනාව මත ගණනය කරන ලද නොගෙවූ සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් වශයෙන් රු.14,909,235 ක් ගෙවීමේදී සේවකයින්ගේ කොටස වශයෙන් ගෙවිය යුතු රු. 5,324,727 ක මුදලද කොමිෂන් සභාවට ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත අනුව ඊළග මාසයේ 15 දිනට පෙර විදුලි සංදේශ බදු, කොමිෂන් සභාවට ගෙවිය යුතු වුවද බදු ගෙවිය යුතු ආයතන 03 ක් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ බදු ගෙවීම් කර නොතිබුණි. තවද මෙයින් ආයතන 02 ක් සම්බන්ධයෙන් පනතේ 6(3),(4),(5),(6) වගන්ති අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) ක්‍රියාකරුවන්ගේ මාසික වාර්තා අනුව විදුලි සංදේශ බදු හා සෙස් බදු මාසිකව අයකරනු ලබන අතර මූල්‍ය වර්ෂය අවසන් වූ පසුව වරලත් ගණකාධිකාරීවරයා විසින් මෙම බදු වර්ග දෙක සඳහා ඉදිරිපත් කරනු ලබන සැසඳුම් ප්‍රකාශයක් මගින් වර්ෂයට අදාල බදු ප්‍රමාණය තහවුරු කරගැනීමේ ක්‍රමයක් කොමිෂන් සභාව විසින් හඳුන්වා දී තිබුණි. එසේ වුවත් 2014 වර්ෂය හා සමාලෝචිත වර්ෂය සඳහා පිළිවෙලින් ආයතන 06 කින් හා ආයතන 14 කින් 2016 ජූනි 06 දින වන විටත් එම සැසඳුම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභා තීරණයකට අනුව ලොන්ඩන් පෙදෙසේ පිහිටි ගොඩනැගිල්ලක් මාසිකව රු. 300,000 ක් බැගින් කුලී ගෙවීමේ පදනම මත මිලගණන් කැඳවීමකින් තොරව, මු.රෙ. 835(2)(ඇ) වගන්තිය හා 2010 මැයි 04 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ නියමයන්ට පටහැනිව 2014 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට එක් අවුරුදු කාල සීමාවක් සඳහා කුලියට ලබාගෙන තිබුණි. ගොඩනැගිල්ල ලබාගත් අරමුණ සඳහා නොයොදවා නිශ්කාර්යව පැවති අතර කුලියට ගෙන මාස 07 කට පසු මෙම ගොඩනැගිල්ල නැවත ආපසු භාරදී තිබුණි. අත රැඳවුම් මුදල් ලෙස රු. 1,800,000 ක් හා 2014 වර්ෂයේ නොවැම්බර් සිට 2015 අප්‍රේල් දක්වා මසකට රු. 225,000 බැගින් රු. 1,350,000 ක් වශයෙන් එකතුව රු. 3,150,000 ක් ගොඩනැගිලි හිමිකරු වෙත ගෙවා තිබුණි. එම කාලය තුලදී ජලය/ විදුලිය බිල්පත්, ආරක්ෂක වියදම්, අළුත්වැඩියා වියදම් හා වෙනත් විවිධ වියදම් සඳහා රු. 3,701,942 ක් ද පරිගණක හා වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රු. 8,426,486 ක්ද වැයකර තිබුණි. බදු කාලය තුළ කුලී වශයෙන් ගෙවන ලද රු. 1,350,000 ක මුදල ආර්ථික නොවන වියදමක් වූ අතර රැඳවුම් මුදල් ලෙස ගෙවූ රු. මිලියන 1.8 ක මුදල 2016 ජූනි 27 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ අරමුණු ඉටුකිරීමට අදාල වේ යැයි සැළකිය නොහැකි වූ චිත්‍රපටියක් හා ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් කොමිෂන් සභා අනුමැතිය මත සභාව විසින් පිළිවෙලින් රු. 64,383,813 ක් හා රු. 7,956,000 ක් ගෙවීමට එකඟ වී තිබුණ අතර චිත්‍රපටිය

හා ටෙලිනාට්‍ය නිෂ්පාදනය වෙනුවෙන් පිළිවෙලින් රු. 32,191,906 ක මුදලක් සහ රු.7,160,400 ක් සමාජ වගකීම් වියදම් ලෙස සලකා නිෂ්පාදකයින් වෙත ගෙවා තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

-----------------------------

2015 වර්ෂයේ කාර්ය මණ්ඩල නිලධාරීන් හා ඔවුන්ගේ පවුල් සඳහා සුහද හමුව හා චාරිකාව වෙනුවෙන් නවාතැන් ගැනීම, ආහාරපාන හා වෙනත් වියදම් සඳහා රු. 4,045,841 ක මුදලක් දරා තිබුණි.

**4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

------------------------------

**4.5.1 නෙළුම් කුළුණ ඉදිකිරීම**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ඉදිකිරීම් ප්‍රගතිය:**

යථෝක්ත ඉදිකිරීමට අදාල කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ඉදිකිරීම් කටයුතු 2012 නොවැම්බර් 12 දිනෙන් ආරම්භ කර 2015 මැයි 12 දින වන විට දින 912 කින් නිම කළ යුතුව තිබුණද එදින වන විට කොන්ක්‍රීට් සැකිල්ල පමණක් නිමකර තිබුණි. 2015 අගෝස්තු 28 දිනැති කොමිෂන් සභා තීරණය අනුව කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් මාසය දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ කමිටුව 2015 ජනවාරි 02 දිනෙන් පසුව දෙසැම්බර් 31 දින දක්වාම රැස්වී නොතිබුණි.

**(ආ) විදුලි සෝපාන හා විදුලි තරප්පු පෙල සවිකිරීම:**

(i) කොන්ත්‍රාත් ගිවිසුම සමඟ ඉදිරිපත් කර තිබූ නිශ්චයාත්මක මාර්ගයට (Critical Path) අනුව 2014 ජූලි මාසයේ ආරම්භ කර මාස 08 ක් තුළ එනම් 2015 මාර්තු වන විට යාන්ත්‍රික විදුලි හා විශේෂ උපකරණ සවිකිරීමේ කටයුතු අවසන් කළ යුතු වුවද කිසිදු උපකරණයක් සවිකිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) විදුලි සෝපාන හා විදුලි තරප්පු පෙළ සවි කිරීම සඳහා ව්‍යාපෘති උපදේශක ඒකකය (PCU) මගින් තාක්ෂණික හා මූල්‍යමය ඇගයීම් වාර්තාව කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා 2014 ඔක්තෝබර් 13 දින ඉදිරිපත් කර තිබුණද අනුමැතිය ලබාදී තිබුණේ 2016 මාර්තු 29 දිනදීය. එහිදී ඇ.එ.ජ.ඩො. 1,757,898 ක අතිරේක වැයක්ද අනුමත කර තිබුණි.

(iii) විදුලි සෝපාන සවිකිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ගැටළු මතුවී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති බව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විගණනයට දන්වා තිබුණද අදාල කමිටු වාර්තාව විගණනයට ඉදිරිපත් කිරීමකින් තොරව එම වාර්තාවේ ඇතුළත් යෝජනා පමණක් විගණනය වෙත ලිඛිතව ඉදිරිපත් කෙරුණි.

**(ඇ) ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනය:**

2012 සැප්තැම්බර් 17 දින චීන රජයේ අපනයන ආනයන බැංකුව (The Export – Import Bank of China) සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ ඇතිකරගත් ණය ගිවිසුමට අනුව ලන්ඩන් අන්තර් බැංකු පොළී (LIBOR)අනුපාතිකයට සියයට 4 ක ස්ථාවර පොලී ආන්තිකය එකතු කර ණය පොළී අනුපාතිකය සකස් විය යුතුය. එසේ වුවද ශක්‍යතා අධ්‍යයන වාර්තාවෙහි ණය ගෙවීම් පිරිවැය ගණනයේදී ස්ථාවර පොලී ආන්තිකය සියයට 3.5

ක් ලෙස සලකා තිබූ බැවින් ව්‍යාපෘතියේ ණය ගැණුම් පිරිවැය රු. මිලියන 265 ක් අඩුවෙන් පෙන්නුම් කිරීම, ව්‍යාපෘතියේ රක්ෂණ පිරිවැය රු. මිලියන 682 ක් අඩුවෙන් සලකා තිබීම සහ ව්‍යාපෘතියේ අයවැයගත ආදායමෙහි වර්තමාන අගය (Present Value) ගණනය කිරීම සඳහා වන ප්‍රාග්ධන පිරිවැය අනුපාතය වූ (වට්ටම් අනුපාතය) සියයට 4.32 වෙනුවට සියයට 4 ක වට්ටම් අනුපාතිකයේ යොදා ගැනීම යන ප්‍රමාණාත්මක විචලතා හේතුවෙන් තක්සේරු කර තිබුණු ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය වෙනස් විය හැකි බව නිරීක්ෂණය විය.

**4.5.2 හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම**

---

ඉදිකිරීම් කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 2,663 ක් වූ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2014 අගෝස්තු 10 දින ආරම්භ කර 2016 ජූලි මාසය වන විට නිමකළ යුතු විය. 2015 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවා තිබුණු මුදල රු.මිලියන 508 ක් වූයෙන් එය ගිවිසුම් ගත වටිනාකමින් සියයට 19 ක් විය. මෙම ව්‍යාපෘතියේ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් විෂය පථය සීමා කිරීමට සිදුවී තිබුණු බව වාර්තා කර තිබුණද 2016 ජුනි 23 දින වන විට ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 291 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 218 ක් විය. මෙහිදී පුරප්පාඩු සංඛ්‍යාව 89 ක් හා අතිරික්ත සංඛ්‍යාව 16 ක් විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිර තනතුරු 06 ක් සඳහා 16 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඇ) අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව උපදේශකවරුන් 05 දෙනෙකු පත්කර එකතුව රු.719,000 ක මාසික පාරිශ්‍රමිකයක් ගෙවා තිබූ අතර උපදේශකවරුන් දෙදෙනෙකු සඳහා රාජකාරී ලැයිස්තුවක් ලබාදී නොතිබුණි.

(ඈ) කොමිසමේ පවතින සේවක හිඟය පහත කරුණුවලට බලපා ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබුණි.

(i) සංඛ්‍යාත කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රියාකරන පුහුණු නිලධාරීන්ගේ පවතින හිඟය නිසා සංඛ්‍යාත ගාස්තු අයකිරීමේ රෙගුලාසි හඳුන්වා දීමට කටයුතු කරදීමට නොහැකි වූ බව,

(ii) සංඛ්‍යාත පිරික්සුම් සඳහා නිලධාරීන් දෙදෙනෙකු පමණක් යොදවා ඇති බැවින් දිවයින පුරා සංඛ්‍යාත පිරික්සුම් කිරීමට හැකියාවක් නොමැති බව, සහ

(iii) ගුවන් විදුලි තාක්ෂණ පිරික්සුම් කටයුතු සඳහා විශේෂඥ දැනුම ඇති නිලධාරීන්ගේ හිඟය නිසා වසර 17 ක් පැරණි සංඛ්‍යාත පිරික්සුම් පද්ධතිය වෙනුවට නව සංඛ්‍යාත පිරික්සුම් පද්ධතියක් ලබාගැනීමේ ප්‍රසම්පාදන කටයුතු කළ නොහැකි වූ බව.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2016 මැයි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂමේ අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ සහකාර විගණන නිලධාරීන් 03 දෙනෙකු අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන අභ්‍යන්තර විගණක හා එක් සහකාර විගණන නිලධාරිණියක් පමණක් පත්කර තිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන අංශය විසින් ප්‍රමාණවත් ක්ෂේත්‍රයන් විගණනයට භාජනය කර නොතිබූ අතර කොමිෂන් සභාව මගින් ඉදිකරනු ලබන නෙළුම් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය හා හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම පිළිබඳ විගණන පරීක්ෂණ සිදුකර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

කොමිෂන් සභාව විසින් 2015 මාර්තු 10 දින අනුමත කර තිබුණු අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය අගයන් අතර සියයට 10 සිට සියයට 46 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. තවද අයවැය ලේඛනයට ඇතුලත් කිරීමකින් තොරව වැය විෂයයන් 10 ක් සඳහා රු. 9,309,870,507 ක් වැයකර තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපති වෙත වාර්තා කළ අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබීම. |
| (ආ) ණය පාලනය | දීර්ඝ කාලීනව පරිශේෂ වූ ණය ශේෂ පැවතීම හා ණය අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතීම. |
| (ඇ) ආදායම් පාලනය | ආදායම් එකතු කර ගැනීම සඳහා ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන අනුමත කරගෙන නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඇ) | ආයෝජන | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පත්වල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම. |
| (ඉ) | දීමනා ගෙවීම් | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභා තීරණ මත පැමිණීමේ දීමනා, ප්‍රසාද දීමනා, සන්නිවේදන දීමනා හා නිවාස කුලී දීමනා ගෙවීම. |
| (ඊ) | කොන්ත්‍රාත් පාලනය | නෙළුම් කුළුණ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම.<br>හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හැරීම. |